ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමණාකරණ අධ්‍යයන පීඨය

ව්‍යවසායකත්ව සහා කුඩා ව්‍යාපාර සඳහා වන උසස් සහතිකපත්‍ර පාඨමාලාව (ESBM)

# AFC2308 – ආර්ථික විද්‍යාව සඳහා හැඳින්වීම
## අවසාන ඇගයීම් පරීක්ෂණය – 2024 / 2025
## කාලය පැය දෙකයි (02)

දිනය: 24.05.2025 වේලාව: ප.ව 01.30 සිට ප.ව 03.30

උපදෙස්:

- ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 06න් සමන්විත වන වේ. ප්‍රශ්න 04ට පමණක් පිළිතුරු සපයන්න.
- විභාග අංකය පැහැදිලිව පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.
- ප්‍රශ්න පත්‍රය මුද්‍රිත පිටු දෙකකින් සමන්විත වේ.
- සියළුම පෙරවැඩ පැහැදිලිව පෙන්වන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ.(ලකුණු 25ක්).
- වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කල හැක.

### ප්‍රශ්න අංක 01

i. හිඟකම නිර්වචනය කර එය ආර්ථික විද්‍යාවේ පදනම ලෙස සලකන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

ii. අවස්ථික පිරිවැය යනු කුමක්ද? ව්‍යවසායකයෙකුගේ දෘෂ්ටිකෝණයෙන් උදාහරණයක් දෙන්න. (ලකුණු 08යි)

iii. සම්පත් වල විකල්ප භාවිත, තේරීමේ ප්‍රශ්නයට හේතුවන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09යි)

### ප්‍රශ්න අංක 02

i. ඉල්ලුම් නීතිය පැහැදිලි කර සහ එය පහළට බෑවුම් වන වක්‍රයකට හේතු වන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 06යි)

ii. සැපයුම් වක්‍රයේ විතැන් වීමක් ඇතිවීමට හේතුව කුමක්ද? එය වක්‍රය දිගේ ලක්ෂයක් චලනය වීමෙන් වෙනස් වන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09යි)

iii. පාරිභෝගික ආදායමේ වැඩිවීමක් සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුමට බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

### ප්‍රශ්න අංක 03

i. නිෂ්පාදනයක් සඳහා ඉල්ලුම සමීකරණය $Qd = 80 - 4P$ සහ සැපයුම් සමීකරණය $Qs = 20 + 2P$ ලෙස දී ඇති විට, සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 10යි)

ii. ආදේශක භාණ්ඩයක මිල අඩුවීම මෙම නිෂ්පාදනයේ ඉල්ලුම් වක්‍රයට බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 07යි)



69

iii. සැපයුම් ප්‍රමාණයේ වෙනසක් සහ සැපයුමේ වෙනසක් අතර වෙනස කුමක්ද? සැපයුමේ වෙනසක් ඇති කරන සාධක සඳහා උදාහරණයක් සපයන්න. (ලකුණු 08යි)

## ප්‍රශ්න අංක 04

i. ආන්තික ඵලදාව නිවර්වනය කර නිෂ්පාදන තීරණ වලදී එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

ii. කෙටි කාලීන මුළු ස්ථාවර පිරිවැය (TFC) සහ මුළු විචල්‍ය පිරිවැය (TVC) අතර වෙනස දක්වන්න. (ලකුණු 07යි)

iii. නිෂ්පාදන සාධක හතර ලැයිස්තුගත කර නිෂ්පාදන තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ඒවායේ කායර්භාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12යි)

## ප්‍රශ්න අංක 05

i. සමාහාර ඉල්ලුම යනු කුමක්ද සහ එහි ප්‍රධාන සංරචක මොනවාද? (ලකුණු 07යි)

ii. කෙටි කාලීන සමස්ත සැපයුම් වක්‍රය දිගු කාලීන වක්‍රයෙන් වෙනස් වන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09යි)

iii. පූර්ණ රැකියා නියුක්තිය ප්‍රධාන සාර්ව ආර්ථික ඉලක්කයක් වන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 09යි)

## ප්‍රශ්න අංක 06

i. අංශ දෙකක ආර්ථිකයක ආදායමේ චක්‍රීය ප්‍රවාහය විස්තර කරන්න. (ලකුණු 08යි)

ii. ජාතික ආදායම යනු කුමක්ද? එය වියදම් ප්‍රවේශය තුලින් එය ගණනය කරන්නේ කෙසේද? (ලකුණු 07යි)

iii. සාධාරණ ආදායම් ව්‍යාප්තිය ආර්ථික ස්ථාවරත්වයට සහාය වන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

- සියළුම හිමිකම් ඇවිරිණි -